සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## බුද්ධ ධර්මය

කාලය පැය 2යි

නම / විභාග අංකය:

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

### I කොටස

- අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සිදුහත් කුමාරයාගේ පියා වූයේ,
(1) කොසොල් රජතුමා. (2) සුප්‍රබුද්ධ රජතුමා. (3) බිම්බිසාර රජතුමා. (4) සුද්ධෝදන රජතුමා.

02. බෝසත් උපත සමඟ සිදු වූ අසිරිමත් සිදුවීමක් නම්,
(1) මහමායා දේවිය අපූරු සිහිනයක් දැකීම ය. (2) සතරවරම් දෙවිවරු සාධුකාර දීම ය.
(3) සුද්ධෝදන රජතුමා බෝසත් කුමරු වඩා ගැනීම ය. (4) මහමායා දේවිය කළුරිය කිරීම ය.

03. සතර බ්‍රහ්ම විහරණ නිවැරදි ව සඳහන් පිළිතුර වන්නේ,
(1) මෙත්තා,කරුණා,කාලය,මුදිතා (2) මෙත්තා,කරුණා,උපේක්ඛා,දීපය
(3) කාලය,දීපය,දේශය,කුලය (4) මෙත්තා,කරුණා,මුදිතා,උපේක්ඛා

04. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,
(1) නෙලුම් මල ය. (2) නිල් මානෙල් මල ය. (3) සුදු මානෙල් මල ය. (4) රතු නෙලුම් මල ය.

05. දෙමාපියන් තම දරුවනට ඉටුකළ යුතු යුතුකමක් නම්,
(1) ශිල්ප ඉගැන්වීම (2) අවශ්‍යතා ඉටුකර දීම
(3) පරම්පරාව රැක ගැනීම (4) මිය ගිය පසු පින්දීම

- අංක 06-10 දක්වා වගන්ති නිවැරදි ලෙස ගළපා ඉරකින් යා කරන්න.

| | |
|---|---|
| 06. බිම්බිසාර රජතුමා | දෙව්දහ නුවර |
| 07. මහමායා දේවිය | සොත්ථිය බමුණා |
| 08. කුසතන පූජා කළේ | අලාර කාලාම |
| 09. සිදුහත් තාපසතුමාගේ ගුරුවරයා | ඇසළ පෝදින |
| 10. සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ | රජගහ නුවර |



LIVEWORKSHEETS

● අංක 11-15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(කැඩපත / ත්‍රිවිද ශික්ෂා / මුදල් පසුම්බියක් / සුමන / මස)

11. ශීල,සමාධි,ප්‍රඥා යනු.........................................ය.

12. බුදුරජාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ට හොඳ නරක පැහැදිලි කරදීම සඳහා උදාහරණයකට ගත්තේ...............
කි.

13. ...................................දැක සර්පයා දුටුවාදැයි, ආනන්ද හාමුදුරුවන්ට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ ය.

14. අභියෝග ජයගත් තරුණයෙකි........................................මානවකයා.

15. ශ්‍රද්ධාවෙන් යුතුව බුදුරජාණන් වහන්සේට මල් පූජා කළේ..........................මල්කරු ය.

● අංක 16-20 දක්වා වගන්ති හරි නම් (✓) ලකුණද වැරදිනම් (X) ලකුණද වරහන තුළ යොදන්න.

16. මංගල,සුමන,රේවත,සෝභිත යන බුදුරජාණන් වහන්සේලා බුද්ධත්වයට පත්වූයේ නා ගස් සෙවනෙහි ය. ( )
17. ශීල ශික්ෂාවට අයත් වන්නේ මාර්ග අංග තුනක් පමණි. ( )
18. වැරදි නොකර ඉන් වැළකීමෙන් පමණක් සිල්වතෙකු බවට පත් විය හැක. ( )
19. සීලය යනු සිත,කය,වචනය සංවර කර ගැනීම යි. ( )
20 .අලීනතා යනු වැඩිහිටි උපදෙස් ලැබීම යි. ( )

(2X20 = 40)



LIVEWORKSHEETS